# අධර්මය දුරුකළ දුරුත්ත

**♦ සම්මානිත මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම විසිනි**

දුරුත්ත යන්න භෞගෝලීය වශයෙන් හා ඓතිහාසික වශයෙන් යයි ප්‍රධාන ලෙස දෙයාකාරයකට අර්ථනිරූපණය කරන්න පුළුවන්. භෞගෝලීය වශයෙන් බලන කල ශ්‍රීලංකාවට ඉතාමත්ම දුරින් ඉර ගමන් කරන්නෙ සාමාන්‍යයෙන් දෙසැම්බර් මැද භාගයේ සිට ජනවාරි මැද භාගය දක්වා කාල සීමාවට ගැනෙන දුරුතු මාසයේ දී යි. ඒ නිසා දුරුතු මාසයට වැටෙන දෙසැම්බර් 22 දා ඉර ගමන්කරන්නෙ නිරක්ෂයට අංශක 23 ½ ක් දකුණින් පිහිටි මකර නිවර්තනයට ලම්භාකාරව ඕස්ට්‍රේලියාව හරහායි.

පුරාවෘත්තගත ඓතිහාසික වාර්තා අනුව බුදුහිමියන් ප්‍රථම වරට සිරිලක් බිමට වැඩමකර ලක්බිමින් අධර්ම බලය දුරු කර ශ්‍රී සද්ධර්ම බලය ස්ථාපනය කළේ බුද්ධත්වයෙන් නම මාසයකට පසු උදා වූ දුරුතු පුන් පොහෝදායි. සද්ධර්ම බලයෙන් අධර්ම බලය දුරුවන්නේ පහනක් දැල්වූ කල ඒ අවට ඝන අන්ධකාරය දුරුවන්නාසේයි.

භෞතික විද්‍යාව අනුව ආලෝකය යනු භෞතික ශක්තියක්. එහෙත් අඳුර යනු භෞතික වශයෙන් ගතහැකි ශක්ති විශේෂයක් නොවෙයි. ආලෝක ශක්ති යෙන් තොර තැනක ඇතිවන ස්වභා වයයි. ආලෝකයක් නැති හැම තැනකම ඇත්තේ අඳුරයි. අපට අඳුර දැනෙන්නේ භෞතික ශක්තියකින් ආලෝකය ආවරණය වුනාමයි. රෑ අඳුර යනු පොළවෙන් ඉර මුවා වූ කල ඇතිවන පොළවේ හෙවනැල්ලයි. දහවල් කල ඇත්තේ ආලෝකයයි.අඳුර පමණක් ඇත්තේ සියළු භෞතික වස්තූන් උරාගෙන ගිල ගන්නා බ්ලැක් හෝල් නම් දැවැන්ත අන්ධකාර අගාධ වලයි. භෞතික කියන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා භූත ධර්මයන්ගෙන් නිර්මිතවූ දේට යි. අප දකින ආලෝකයත් භෞතිකයි එහෙත් රහතන් වහන්සේලා අත් දකින නිර්වානා ලෝකය අභෞතික යි. බුද්ධත්ව යේදී ආලොකො උදපාදි වීය යනුවෙන් කියවෙන්නේ අභෞතික නිර්වානා ලෝකය උදාවූ බවයි. දුරුතු පුන් පොහෝ දිනක බුදුහිමියන් අධර්මාන්ධ කාරය දුරුකරමින් සිරිලක පැතිරුවේ ඒ නිර්වානා ලෝකයයි. සමන් දෙවියන් සෝවාන් වූයේ ඒ ආලෝක දර්ශනයෙනුයි.

නිර්වාණ ලෝකය ඉතාමත්ම සියුම් භෞතික ශක්ති විශේෂයක් වූ සිතට දැනෙන්නක්. භෞතික ආලෝකය භෞතික ඉන්ද්‍රියයන්ගෙන් සැදුණ ශරීර යට දැනෙන්නක්. අපේ ගත බොහෝ විට ලෙඩවන්නේ සද්ධර්මා ලෝකය දුරුවී අධර්මාන්ධ කාරය බිහිවූ විටයි. වෙන ලෙසකට කියත හොත් ගත ලෙඩවන්නේ කෙලෙස් මලින් සිත ලෙඩ වූ විටයි. සීතල වැඩිකමට ගත සිත දෙකම ලෙඩ වෙන අරුතෙනුත් දුරුත්ත හඳුන්වන්න පුළුවන්. ඒ දුරුතු යන වචනය හැදෙන්නෙ අශුභ නොහොත් නරක යන තේරුම දෙන **දු** යන උපසර්ගයත්, ඉරුතු යන යන පදයත් එක්වෙලයි. (දු + ඉරුතු = දුරුතු) ශාරීරික රෝග වැඩියෙන්ම වැළදෙන්නෙත් ක්ලේශ ක්‍රම යෙන් අවදිවී සිත ලෙඩ වෙන් නෙත් දුරුත්තේ සීතලටයි. ඉන් වැලකීමට නම් මූලිකවම කළ යුත්තේ අසද්ධර්මාන්ධාකාරය දුරුකරන සද්ධර්මාලෝකය උදා කර ගැනීමයි.

සද්ධර්මාලෝකයෙන් අසද්ධර්මාන්ධකාරය දුරුකිරීම ගැන පුරාවෘත්ත මගින් කියැවෙන්නේ බුදුහිමියන් සිරිලක් බිමට අරක් ගෙන සිටි යක්ෂයන් සිය සද්ධර්ම බලයෙන් ගිරි දිවයිනට පළවා හැරිය ලෙසයි. අපේ ගත ලෙඩකරන යකුන් වන්නේ කිපුණු වා, පිත්, සෙම් දෝසයි. අපේ සිත ලෙඩකරන යකුන් වන්නේ ලෝභ, ද්වේශ හා මෝහ යන ක්ලේශ මූලයි. අප තුළ අරක්ගෙන සිටින යකුන් ලෙස හැඳින්විය හැක්කේ මොහාන්ධ කාරය තුළ වැජඹෙන ලෝභ, ද්වේශ, ඊර්ෂ්‍යා, ක්‍රෝධාදී ක්ලේශ ධර්මයි. යකුන් දුරුකරගත හැක්කේ අප තුළ සද්ධර්මා ලෝකය අවදිකර ගැනීමෙනුයි.

අපට අපේ ශාරීරික රෝග මෙන්ම අපේ චෛතසික ක්ලේශ දෝෂ නම් මානසික රෝග දුරුකළ හැක්කේ ඒවා අවදි වන විට අවදියෙන් සිටීමෙනුයි. නරක ඍතුව යන තේරුම දෙන දුරුත්ත අපේ ශාරීරික හා මානසික දොස් ස්වාභාවිකව අවදිකරන මාසයක් නිසා දුරුත්ත කියන්නෙ ක්ලේශ ධර්මයන් දුරුකර ගැනීමට අවදි යෙන් සිටිය යුතු මාසයක්.

**Harrow UK**

# එතෙරට ගොස් දමා යන්න!

"මහණෙනි, මෙය හොඳින් අසාගන්න...!

මිනිහෙක් ගමනක් යාමට මගට බැසී. ටික දුරක් යන විට මහා ගං වතුරකි. රළ නංවමින් දිය කඳ ගලා බැසී. එතෙර විය නොහැකිය. කෙසේ හෝ එගොඩට යා යුතු ද වන්නේය.

ඒ මිනිහා අතු කොළ වැල් කඩා පහුරක් බැන්දේය. එය දියට දමා, එහි එල්ලී, අතින් පයින් වෙර වීරිය කොට යාන්තම් එගොඩට පැන ගත්තේ ය.

මහණෙනි, දැන් එගොඩ වූ ඒ මිනිසා මට මෙගොඩට ඒමට පිහිට වූයේ මේ පහුර ය.... මෙය අතහැර දමා යන එක හොඳ නැත.... කරගහ ගෙන ගියොත් හොඳය....යි එය කරතබාගෙන යයිද....? "




" නැත, ස්වාමීනි, කිසිම මිනිහෙකු එසේ කරන්නේ නැත. එගොඩ වූ පසු පහුර අත හැර දමා යනු ඇති....."

" මහණෙනි, මගේ ධර්මයද පහුරක් වැනිය. එය සසරින් එතෙර වීම පිණිස මිස කරගහගෙන යාම සඳහා නොවේ......!

**(මජ්ජිම නිකායට අයත් කුල්ලූපම සූත්‍රයෙනි )**

**පූජ්‍ය පොරවගම ඥාණසිරි හිමි සුසිලාරාමය - බඹරවාන**


# Duke's Court Travel

DUKE'S COURT TRAVEL Travel Management

## Fly to Colombo

| | | | |
|---|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £365 | + Taxes |
| QATAR AIRWAYS | Qatar Airways | fr £320 | + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £260 | + Taxes |
| Emirates | Emirates | fr £430 | + Taxes |
| ETIHAD | Etihad Airways | fr £244 | + Taxes |
| OMAN AIR | Oman Air | fr £189 | + Taxes |
| | Jet Airways | fr £313 | + Taxes |

**Note:** All fares mentioned are low season / terms & conditions apply.

**020 8748 3535**

ATOL AITO IATA 204 King Street, London W6 0RA


## A Course on Stress Management & Mindfulness

## ආතති පාලනය සහ සිහිනුවණ වැඩීම

2011 Jan. 19 - Introduction
2011 Jan 26 - Mindfulness that leads to relaxation
2011 Feb. 02 - Experience of wholesome Joy, Happiness & Calming
2011 Feb. 08 - The Way of Living in Harmony

Time -18.00 -19.30 ( Each talk is followed by a question time and a practical session within the given time.

*Venue* : East London Buddhist Cultural Centre
33 Maybury Road, Plaistow, London E13 8RZ
Phone 0207 476 0681

**Meditation Teacher & Course Conductor Sumana Ratnayaka, Senior Lecturer - University of Peradeniya.**

**This is a gift of Dhamma. However your voluntary donations will be accepted with gratitude for the running costs.**

*මෙම භාවනා වැඩසටහන ඔබේ යහපත පිණිස හේතුවෙනවා ඇත. එනිසා කලාතුරකින් ලැබෙන මෙවැනි මහඟු අවස්ථාවක් අපතේ නොහරින්න!*

**All are welcome !**


මේ උත්සව සමයේ FASTCASH වෙතින් ගණුදෙනුකාර ඔබ සැමට විශේෂ වූ දීමනාවක්!

එන්න... අප සමඟ එකතු වී ඔබගේ මුදල් නොමිලේ ශ්‍රී ලංකාවට යවන්න.

ඔබගේ මිතුරාට අපගේ FASTCASH සේවය හඳුන්වා දීමෙන්, ඔබත් මිතුරාත් දෙදෙනාම මෙම විශේෂ දීමනාවට හිමිකරුවන් වන්න.

FAST CASH SEND TODAY - COLLECT TODAY

COMMERCIAL BANK BOC HNB SEYLAN NSB HSBC PEOPLE'S BANK සම්පත් බැංකුව SampathBank NDB bank Standard Chartered

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාකා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

020 8886 4488

Fastcash Financial Services Ltd
125-127 Bramley Road, Oakwood, London, N14 4UT
www.efastcash.biz

Trading Hours Open 7 days
Mon-Fri 9.00am-6.00pm
Sat - 9.30am-5.30pm
Sun- 10.00am-4.00pm

Strong. Safe. Reliable. MCG Mike Cooke Group

අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට සාමය සතුට පිරි, සුබ නව වසරක් වේවා!


